**ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීතී හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 31 දින දෙපාර්තමේන්තුවේ වැඩබලන ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.6 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධි විධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු තිබුණු බව නිරීක්ෂණය විය

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම.<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.1.2<br>2.2 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | අනුකූල නොවීම. | 2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු. | 2.4.1(ආ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**2.1.1** දෙපාර්තමේන්තුවේ දැක්ම, යහපාලනය සඳහා නීතීන් ප්‍රතිසංස්කරණය කිරීම වන අතර 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව එහි ප්‍රධාන අරමුණු හා කාර්යයන් 11 ක් දක්වා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ඉන් ප්‍රධාන කාර්යයන් කිහිපයකට පමණක් අදාල නීති සංශෝධන සඳහා යෝජනා 08 ක් ඉදිරිපත් වී තිබූ අතර ඉන් නිර්දේශ දෙකක් කෙටුම්පත් බසට හැරවීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙතද, නිර්දේශ 01 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයටද යොමු කර තිබූ අතර කටයුතු නිම නොවී තවදුරටත් සාකච්ඡා මට්ටමේ පවතින නීති නිර්දේශයන් සංඛ්‍යාව 05 ක් විය.

### 2.1.2 සැලැසුම් කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

දෙපාර්තමේන්තුවට රු.245,900 ක් වටිනා පරිඝනක හා උපාංග මිලදී ගැනීම සඳහා පත් කළ තාක්ෂණික ඇගයීම් කමිටුවට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව මූලා කරුණු පිළිබඳ පරිණත දැනුමක් ඇති පුද්ගලයෙකු පත් කර නොතිබුණි.

**2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 13.80 | 11.54 | 2.26 | 16 |
| | මූලධන | 2.50 | 2.18 | 0.32 | 13 |
| | **එකතුව** | **16.30** | **13.72** | **2.58** | **16** |
| 2014 | පුනරාවර්තන | 13.95 | 10.82 | 3.13 | 22 |
| | මූලධන | 1.75 | 0.93 | 0.82 | 47 |
| | **එකතුව** | **15.70** | **11.75** | **3.95** | **25** |
| 2015 | පුනරාවර්තන | 15.00 | 10.16 | 4.84 | 32 |
| | මූලධන | 2.00 | 1.13 | 0.87 | 43 |
| | **එකතුව** | **17.00** | **11.29** | **5.71** | **34** |
| 2016 | පුනරාවර්තන | 14.63 | 12.14 | 2.49 | 17 |
| | මූලධන | 2.03 | 1.43 | 0.60 | 29 |
| | **එකතුව** | **16.66** | **13.57** | **3.09** | 19 |
| 2017 | පුනරාවර්තන | 15.34 | 14.78 | 0.56 | 4 |
| | මූලධන | 1.95 | 1.73 | 0.22 | 11 |
| | **එකතුව** | **17.29** | **16.51** | **0.78** | 4 |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.100,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 07 සිට සියයට 38 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.4 අනුකූල නොවීම්

### 2.4.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත් කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත් වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව සිදු කළයුතු බව දක්වා ඇතත් ලේකම් තනතුර 2015 දෙසැම්බර් මස සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා නිත්‍ය පත් කිරීමක් සිදු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 880 | මුදල්, චෙක්පත් හා බඩු බාහිරාදිය භාරව සිටින ඇප තැබිය යුතු නිලධාරීන් 07 දෙනෙකු සිටියද මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තබා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 1653 | දෙපාර්තමේන්තුවට අයත් වාහන 02 ක දෛනික ධාවන සටහන්වල ධාවනය කළ සැතපුම් ගණන සඳහන් නොකල අවස්ථාවලදී වාහන පාවිච්චි කළ නිලධාරියා අත්සන් තබා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645 | දෙපාර්තමේන්තුවට අයත් සංචිත වාහන 03 කට අදාල ලොග් පොත්වල 2017 වර්ෂයේ ගමන් පිළිබඳ මාසික සාරාංශ සම්පූර්ණ කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 3.3 ඡේදය | වාහන සම්බන්ධයෙන් ඉන්ධන සටහන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2.5 අභ්‍යන්තර විගණනය

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුව බව මුදල් රෙගුලාසි 133 මඟින් අවධාරණය කර ඇත. එහෙත්, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කළයුතුව තිබුණි. මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශ විගණන වැඩසටහනට ඇතුළත් කර තිබුණද, එකී විගණන කාර්යභාරයන් කිසිවක් ඉටුකර නොතිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු.9,411,650 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 04 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 15 | 06 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 07 | 07 | - |
| | එකතුව | 29 | 18 | 11 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් (ලේකම් හා නියෝජ්‍ය ලේකම්) හා ද්විතීයික මට්ටමේ තනතුරු 09 ක් (ගිණුම් සහකාර 01, සංවර්ධන නිලධාරි 02, කළමනාකරණ සහකාර 05, ලඝු ලේඛක තනතුරු 01) පුරප්පාඩු වීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි ඍජු බලපෑමක් කරන බව විගණනයේදී නිරීක්ෂණය විය.